මාතලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුවක්පිටිය ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ වියදම වූ රු.518,419ක් ගිණුම් ගතකර නොතිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ව්‍යාපෘතියක් වෙනුවෙන් ලැබිය යුතු රු.952,866ක මුදල රු.1,191,082ක් ලෙස ණයගැතියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොදු ළිඳ අලුත්වැඩියා කිරීමේ වියදම රු.359,630 ක් ගිණුමේ රු.350,000ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | අළුත්වැඩියා වියදම් රු.689,332 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | රු.100,000ක් වටිනා ඉඩමක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ රු.178,000 කට ඉදිකර තිබූ මුර කුටියේ වටිනාකම ලී බඩු හා සවිකිරීම් යටතේ දක්වා තිබිය දී ගොඩනැගිලි යටතේ ද රු.147,000ක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කිරීම. | 2020 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු රු.3,710,394ක ශේෂයක් හා වර්ෂ 05 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.1,404,959ක් වූ ශේෂ පැවතුණු අතර, 2020 ජූනි 02 දින වන විට රු.57,529,675 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | ගෙවිය යුතු ගිණුම් | | |
| | වර්ෂ 1 ට වැඩි හා වර්ෂ 5 ට අඩු ශේෂ රු.5,768,318 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.2,493,166 ක ශේෂයක් පැවතුණි. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.9,385,805 ක් වූ ගිණුම් විෂයයන් 04 ක අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අයිතිය සනාථ කර ගැනීමට නිවැරදි උපලේඛන පිළියෙල කිරීමට සහ ශේෂ තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට, නිවැරදි උපලේඛන සකස් කිරීමට සහ තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 571(3) | 595,799 | 2012 සිට 2019 කාලයට අදාල කර්මාන්ත අත රැඳවුම් හා මිශ්‍ර තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කිරීමට කටයුතු කරමි. |

2 **මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,664,748 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,712,130 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,349,000 | 1,237,854 | 817,284 | 548,453 | 5,276,200 | 1,247,088 | 3,353,109 | 584,442 |
| කඩ කුලී | 2,075,000 | 400,800 | 583,910 | 29,285 | 1,405,000 | 390,020 | 551,325 | 26,095 |
| බලපත්‍ර ගාස්තු | 2,250,000 | - | 1,666,575 | - | 1,400,000 | - | 1,406,392 | - |
| වෙනත් ආදායම් | 66,855,000 | 41,339,074 | 18,970,164 | 26,170,544 | 22,026,000 | 7,372,742 | 17,277,605 | 3,709,745 |
| එකතුව | 72,529,000 | 42,977,728 | 22,037,933 | 26,748,282 | 30,107,200 | 9,009,850 | 22,588,431 | 4,320,282 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වරිපනම් තක්සේරු කිරීමකින් තොරව 2012 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත බදු අයකරමින් පැවතුණි. | තක්සේරු වාර්තා ලබාගෙන බදු අය කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 ජල ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,210,959 ක ජල ගාස්තු හිඟ මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකළ නොහැකි හිඟ මුදල් විධිමත් අනුමැතිය යටතේ කපා හැරීමටත්, ඉතිරි හිඟ ශේෂ අයකර ගැනීමටත්, කටයුතු කරමි. |
| (ආ) | ජල යෝජනා ක්‍රම 12 ක ජලය බීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න පිළිගත් ආයතනයකින් ජලසාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව ජලය බෙදාහැර තිබුණි. | ගුණාත්මක හා පිරිසිදු පානීය ජලය නිකුත් කිරීමට කටයුතු කල යුතු වේ. | ජල යෝජනා ක්‍රමවල ජලයේ තත්ත්වය පිළිබඳ වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |

2.2.4 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂවලදී පනවන ලද අධිභාරවලට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට රු.1,660,825 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අධිභාර මුදල් සභා අරමුදලට බැර කරන ලෙස දන්වා ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ කටයුතු මෙහෙයවීමේදී පනවාගත යුතු යැයි හඳුනාගෙන තිබූ අතුරු ව්‍යවස්ථා 02ක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා ඉතා කඩිනමින් සකස් කිරීමට කටයුතු කරමි. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම්කර තිබූ ඇස්තමේන්තු වටිනාකම හඳුනානොගත් ව්‍යාපෘති 52 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | නිශ්චිතව හඳුනාගෙන සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | සැලසුම් කරන ලද කර්මාන්ත ඉටු කිරීමට නොහැකි වූ බැවින් ඉදිරියේදී එවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ සිට වරිපනම් බදු සම්බන්ධව ක්‍රියාත්මක කර තිබූ පරිගණක මෘදුකාංගය සහ 2012 වර්ෂයේ මිලදීගෙන තිබූ ජල ආදායම් සම්බන්ධ ක්‍රියාත්මක පරිගණක මෘදුකාංග ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | සක්‍රීය තත්ත්වයට පත් කරගත යුතු වේ. | පරිගණක මෘදුකාංග සකස්කර ක්‍රියාත්මක කිරීම සඳහා මිලදී ගැනීම් සිදුකිරීමට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මට්ටමින් කටයුතු නොකිරීම මත මෙම සභාවේ සේවාවන්වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීමට නොහැකි වී ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රු.1,800,000 ක මුදලක් වෙන්කර තිබුණ ද, විධිමත් සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී වඩාත් සාර්ථක වැඩසටහනකට අනුව අදාළ වර්ෂයේම තිරසර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ගොඩනැඟිලි සැළසුම් අනුමතකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ අයදුම්පත් 980 ක් ලැබී ඉන් 800 ක් අනුමතකර තිබූ නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 76 ක් සඳහා පමණි. | අනුකූලතා සහතික නිකුත් කිරීම හා පසුවිපරම් කටයුතු සිදු කළ යුතු වේ. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස ලිඛිතව දන්වා ඇත. අනුමැතිය නොලැබූ අයදුම්පත් සම්බන්ධව කටයුතු කරමින් පවතී. |
| (ආ) | සභාවේ පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගැනීමකින් තොරව රු.55,362,765 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගත යුතු වේ. | ආයෝජන පොළියද අදාළ බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සංවර්ධන කාර්යයන්ට යෙදවීමට හැකිවීමත් , ඉදිරි ආර්ථික නව උපාය මාර්ග කිහිපයක් ඉටු කිරීමට සභාව හඳුනාගෙන තිබීමත් නිසා මෙම ආයෝජන සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලොක්නගර්වත්ත ඉඩම අනු බෙදුම්කර විකිණීම සඳහා 2018 මාර්තු මාසයෙහි අනුමැතිය ලබාදී තිබූ අතර, පොදු කටයුතු සඳහා සභාව වෙත වෙන්කර තිබූ පර්චස් 65.2 ක ප්‍රමාණයේ ඉඩම් කොටස් 4 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොටස්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම පවරාගෙන ඔප්පු ලබා ගැනීමට ඉදිරි කටයුතු සූදානම් කරමින් පවතී. |

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ෙගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී දින 43 ක් හා 2020 පෙබරවාරි 13 වන දින සිට 17 දින දක්වා කාලය තුළ දැනුම් දීමකින් තොරව සේවයට වාර්තාකර නොතිබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතු වේ. | දින 43 ක් වැටුප් රහිත නිවාඩු සේ සළකා මාසික වැටුපෙන් අයකරගන්නා අතර, ඉදිරියේදී මෙවැනි කටයුතු සිදුවුවහොත් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කරමි. |
| (ආ) | සභාවේ කාර්ය මණ්ඩල තනතුරු 12 ක පුරප්පාඩු 32 ක් සහ තනතුරු 6 ක අතිරික්තතා 12 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගත යුතු අතර, තනතුරුවල අවශ්‍යතාවයන් අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. අවශ්‍යතාවය අනුව බඳවා ගැනීම හේතුවෙන් අතිරික්තතා ඇති වී ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොටස්කර විකුණන ලද කිරිගල්පොත්ත බෙරදේවාලේ වත්ත ඉඩමට අදාල සියයට 1 ක බදු මුදලින් රු.185,130 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අධිකරණ ක්‍රියාමාර්ග තුළින් හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.30,000 ක් වටිනා යතුරු පැදියක් වර්ෂ 6 කට වැඩි කාලයක සිට ධාවනයෙන් ඉවත්කර තිබුණි. | විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | නව තක්සේරු වාර්තාවක් ලබාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.1,400,000 ක් වටිනා ට්‍රැක්ටර් රථයක් 2018 මැයි මාසයේදී ගිනි ගැනීම සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, එම රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.89,990 ක් වැයකර තිබුණි. | වාර්තා කඩිනමින් ලබාගෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. | මු.රෙ. 104(3) අවසන් වාර්තාව ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව වාර්තා කරමි. |

**3.6** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉහළ හරස්ගම මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම - රු.448,624 | | |
| අදාළ කර්මාන්තය ඉටු කිරීමට ප්‍රාදේශීය සභාව සමඟ රු.500,072 ක් වූ මුදලකට ගිවිසුම් ගතවී තිබුණු කොන්ත්‍රාත්කාර සමිතිය විසින් එම කර්මාන්තය ප්‍රාදේශිය සභාවේ සභිකවරයෙකුට අතුරු කොන්ත්‍රාත් ලබාදී තිබුණි. | මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කර නිසි ක්‍රියාමර්ග අනුගමනය කළ යුතු වේ. | අතුරු කොන්ත්‍රාත්තු ලබාදී ඇති බව සනාථ වුවහොත් සමිතිය අසාධු ලේඛන ගත කිරීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපතක් ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු අතර, වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණනය සිදුකරන අතර වාර්තා පිටපත් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |